# මොනරාගල ප්‍රාදේශීය සභාව

# 2022.02.18 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් හත් (47) සභා වාරය 2022.02.18 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයශීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුලකුමාරසිරිමැතිතුමා (ප්‍රතිපක්ෂනායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී | - | ඩබ්.එන්.පී.චන්ද්‍රපාල මිය |

**නොපැමිණීම - නැත**

**පිළිගැනීම**

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ සහ රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ සහ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත කරන ලදි.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03. සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

නැත

## 04. යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

නැත

## 05. යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

### 05.1 ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම, සේවා කටයුතු සිදු කිරීම, අමතර කොටස් මිලදී ගෙන සවි කිරීම වෙනුවෙන් අදාළ කටයුතු කිරීමටත්, ඒ සඳහා වැය වූ මුදල් සභා අරමුදලෙන් වියදම් දැරීමටත් මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| | | |
|---|---|---|
| | LL – 7682 කෘෂ කැබ් රථයේ ස්ටාටර් මෝටරය සවිකිරීමේ ගාස්තු | 3,500.00 |
| i. | LL – 7682 සයිලන්සරය අළුත්වැඩියාව | 3,650.00 |
| ii. | LL – 7682 ටයර් රෝඩ් කොට බාර් එක පුරවා සවිකිරීම. | 2,750.00 |
| iii. | LL – 7682 Foton ෆොග් ලයිට් 02ක් සවිකිරීම | 27,600.00 |
| iv. | LL – 6980 ට්‍රක් රථයේ කොලර් 02 සහ පැච් 02ක් දැමීම | 2,200.00 |
| v. | LL – 6980 ට්‍රක් රථයේ පැති කණ්නාඩිය අළුතින් සවිකිරීම | 3,500.00 |
| vi. | CM – 3078 ගලි රථයේ 100000 km සම්පූර්ණ වාර සේවාව සිදු කිරීම | 131,621.25 |
| vii. | GC – 5148 රථයේ මෝටර් ක්ලච් එක අළුත්වැඩියා කිරීම | 7,000.00 |
| viii. | GC – 5148 රථයේ ඉදිරිපස 600x16 ටයර් 2ක් දැමීම | 26,350.00 |
| ix. | GC – 5148 රථයේ වාර සේවා සිදු කිරීම | 19,295.00 |
| x. | RD – 4488 රථයේ වාර සේවා සිදු කිරීම | 28,450.00 |
| xi. | RD – 9406 ට්‍රැක්ටරය සඳහා හයිඩ්‍රොලික් වැල් 01ක් දැමීම | 1,450.00 |
| xii. | 49-5301 ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටර් බුස් සෙට් දැමීම | 1,450.00 |
| xiii. | 49-5301 ට්‍රැක්ටර් රථයේ වාර සේවා සිදු කිරීම | 16,750.00 |
| xiv. | 49-5301 ට්‍රැක්ටර් රථයට බැටරියක් මිලදී ගැනීම | 26,050.00 |
| xv. | RY – 2510 750x10 Ceat ටයර් 01 ක් සහ ටියුබ් 01 දැමීම | 31,750.00 |

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පෙර මාස වල මෙන්ම මෙම අලුත්වැඩියා කටයුතු සහ ඊට අදාල ගෙවීම් කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

කුඹුක්කන මංසන්ධියේ සිට ඔක්කම්පිටිය මාලිගාවිල දෙසට ගමන් කරනු ලබන පාසල් ළමුන්, මවුවරුන්, ගැබිනි මවුවරුන්, මහළු ගම්වාසීන් ආදී සියලු ජනතාව තම ගම් ප්‍රදේශවලට යාමට කිසිදු ආවරණයක් ආරක්ෂාවක් නොමැතිව මෙම ස්ථානයේ ඇති සියඹලා ගස යට රැඳී සිටිමින් බස් රථවලට ගොඩවීමට බොහෝ වේලාවක් රැඳී සිටින බැවින් මෙම ස්ථානයට මගී ආවරණයක් බට පිරිස් ශ්‍රම දායකත්වයෙන් ඉදිකර ගැනීම සඳහා යම් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස කුඹුක්කන යුධ හමුදා බල සේනා මූලස්ථානයේ බල සේනාධිපති විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කුඹුක්කන හන්දියේ ඔක්කම්පිටිය මාර්ගයේ දැනට මගින් රැඳී සිටින බස් නැවතුම් ස්ථානයට ස්ථිර බස් නැවතුමක් එනම් නව මගී ආවරණයක් ස්ථාපිත කිරීම සඳහා සභා අරමුදල් වලින් අවශ්‍ය වන ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවත්, මේ සඳහා එම ස්ථානයේ අවශ්‍ය වන භූමිය ලබාගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවා අවශ්‍ය කටයුතු සිදු කර ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු එච්.එම්.රවිඳු චතුරංග මහතාගේ කොන්ත්‍රාත් සේවා කාලය 2022.06.30 දිනෙන් අවසන් වන බැවින්, ඔහුගේ සේවා කාලය අවසන් දිනේ සිට ඉදිරියට තවත් වසරකින් දීර්ඝ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභාවේ බිම තලන යන්ත්‍රයේ (ගල් රෝල) යන්ත්‍ර ක්‍රියාකරුවෙකු වශයෙන් කටයුතු කරන මොහු වෙනුවට යෙදවීමට වෙනත් යන්ත්‍ර ක්‍රියාකරුවෙකුද මෙම අවස්ථාවේ නොමැති බැවින් මොහුගේ සේවා කාලය සහා අරමුදලින් වැටුප් ගෙවීමේ පදනම මත තවත් වසරකින් එනම් 2022.06.30 සිට 2023.06.30 දින දක්වා දීර්ඝ කිරීම සුදුසු බවත් ඒ සඳහා අදාල අනුමැතීන් වෙත යොමු කර නිවැරදි ක්‍රමවේදයන්ට යටත්ව අදාල කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 04**

මොනරාගල රත්තනපිටිය විමුක්ති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ 2022 වර්ෂයට නවක සිසුන් ඇතුලත්ව ඇත්තේ 04 දෙනෙකු පමණක් වන බැවින් පෙර පාසල් ශාලාවේ දැල්වල සහ බිත්ති වල තීන්ත ආලේප කර ගැනීම සඳහා මුදල් නොමැති බැවින් මෙම දරුවන් වෙනුවෙන් පෙර පාසල් ගොඩනැගිල්ල පිරිසිදු කර ගැනීමට තීන්ත හෝ යම් ප්‍රතිපාදන මුදලක් හෝ ලබා දෙන ලෙස පෙර පාසල් ගුරුතුමිය (ටී.එරන්දි දිනූෂා මිය) විසින් කර ඇති ඉල්ලීම සඳහා ගරු සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ලියා පදිංචි පෙර පාසලක් වන මෙම පෙර පාසලේ තීන්ත ආලේප කර ගැනීම සඳහා අවශ්‍ය තීන්ත ප්‍රමාණය සහා අරමුදලින් මිලදී ගෙන ලබාදීම සුදුසු බවත් කාර්මික නිලධාරි මහතා වෙතින් අදාළ අනෙකුත් කටයුතු සිදුකර අදාල අනුමැතීන්ට යටත්ව විදිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 05**

මොනරාගල මියනවත්ත අවුරුදු 30 ක පමණ කාලයක සිට ප්‍රජාශාලා ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන නෙළුම් පෙර පාසල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා ප්‍රතිපාදන මුදලක් ලබා දෙන ලෙස පෙර පාසල් ප්‍රධාන ගුරුතුමිය (කේ.ඒ.අයි.ඕ.කේ.දිසානායක මිය) විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉදිරියේදී සභාවට ලැබීමට නියමිත ප්‍රතිපාදන භාවිත කර විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාළ අනුමැතීන්ට යටත්ව  මෙම පෙර පාසල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර දීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 06**

2022 වර්ෂයේ පෙබරවාරි මාසයට ආයතනය සඳහා මිලදී ගනු ලැබූ පහත සඳහන් අත්‍යවශ්‍ය මිලදී ගැනීම් සඳහා  මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට  ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| | | |
|---|---|---|
| I. | සෞඛ්‍ය අංශයට අවශ්‍ය අත් ග්ලවුස් 500මිලදී ගැනීම | රු.  95,000.00 |
| II. | විදුලි අංශය සඳහා  බල්බ 210 ක් මිලදී ගැනීම | රු.203,800.00 |
| III. | ආදාහනාගාරය සඳහා අවශ්‍ය ගෑස් සිලින්ඩර නැවත පිරවීම | රු.153,180.00 |
| IV. | කාර්යාලයේ පින්ටර් සඳහා අවශ්‍ය tonar 25ක්මිලදී ගැනීම | රු.226,500.00 |
| V. | මාර්ග අංශය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | රු.  29,950.00 |

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්යාලයට අත්‍යාවශ්‍ය මෙම මිල දී ගැනීම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මිල දී ගැනීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සභා අරමුදලින් සිදු කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

1) පැරණි පොළ භූමියේ ඉදිකර ඇති නව වෙළෙඳ  සංකීර්ණයට අයත් ගොඩනැගිල්ලේ පවතින අඩු පාඩු සකස් කර අපවිත්‍ර වූ බිත්ති වල තීන්ත ආලේප කිරීම.

2) පැරණි බස් නැවතුම්පළේ ගැලවී ගොස් ඇති වහලයේ කොටස් අලුත්වැඩියා කිරීම.

3) මෙය නව බස් නැවතුම්පොළේ බස් නැවතුම් ස්ථානවල වහලයේ නිතර බස් රථ වැදීම නිසා ගැලවී ඇති ස්ථාන සකස් කිරීමක් බව ගරු සභාපතිතුමා පැහැදිලි කර සිටින ලදි.

4) නව බස් නැවතුම්පොළ භූමියේ පොදු වැසිකිලිය පවතින ස්ථානය සහ සතිපොළට පිවිසෙන මාර්ගය හා සම්බන්ධ වන කුඩා මාර්ගය කොන්ක්‍රීට් යොදා සකස් කිරීම.

5) සති පොල පොළ භූමියේ තොග බඩු මිලදී ගන්නා කොටස තුළ වාහන ඇතුල් කිරීමට නොහැකි වන ලෙස වෙළෙන්දන් විසින් අවහිර කර ඇති කොටස පුළුල් කර සකස් කිරීම.

6) නගරය පුරා විවිධ ස්ථානවල, පදිකවේදිකාවල, සහ වෙළඳ ස්ථානවලට සහ අනෙකුත් ස්ථානවල පිවිසුම් ස්ථානවලට කොන්ක්‍රීට් යොදා සකස් කිරීම.

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව නගරය තුළ මෙම අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු වලට අදාල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු නිවැරදිව සිදු කිරීමත් ඒ සඳහා වන වියදම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් වියදම් කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 08**

1 වසර සිට 13 වසර දක්වා පන්ති පැවැත්වෙන සිසුන් 350 කට ආසන්න පිරිසක් ඉගෙනුම ලබන හුලන්දාව දකුණ වසමේ මො/හුලංදාව දකුණ මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය covid වසංගත තත්වය හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන තිබීම හේතුවෙන් මේ වන විට ක්‍රීඩා කටයුතු කිරීමට නොහැකිව අපවිත්‍ර වී ඇති බැවින් මෝටර්ග්‍රේඩරය යොදා මෙම විද්‍යාලයේ ක්‍රීඩා පිටිය පවිත්‍ර කර සකස් කර දෙන ලෙස විදුහල්පති වන කේ. එම් සරත් කුමාර මහතා විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.ආර්.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
මෙම පාසලට අයත් ක්‍රීඩා පිටිය දූවා දරුවන්ගේ ක්‍රීඩා කටයුතු වෙනුවෙන් මෝටර්ග්‍රේඩරය යොදා සකස් කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 09**

මොණරාගල බෝහිටිය, වැදිකුඹුරෙ හි පදිංචි පී.ජ්.ජී ඉන්ද්‍රාවතී යන අය පදිංචි නිවසට බීමට ජලය ලබා ගැනීම සඳහා ළිදක් හාරා ගැනීමට සභාවට අයත් j.c.b. යන්ත්‍රය ලබාදෙන මෙන් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මගින් පරීක්ෂා කර බලා නිර්දේශ වාර්තාවක් ගෙන මේ සඳහා කළ හැකි උපකාරයක් වේනම් එය සභාව මගින් සිදු කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 10**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය 2022.01.27 දින වන විට සිදුකර අවසන් කර ඇති බැවින්, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහාත් (ඔබ වෙත ලබා දී ඇති) තව ද මෙම වාර්තාවේ ඇතුළත් අබිලි භාණ්ඩ වෙන්දේසි කිරිමට සහ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විනාශ කිරිම සඳහා ද වෙන්දේසි කළ යුතු භාණ්ඩ තක්සේරු කිරිම සඳහා ද පහත සඳහන් නිලධාරින් පත් කර ගැනීම සඳහාත් මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත වෙත යෝජනා කර සිටින ලදි.

1. උපාලි හේරත් මයා - විමර්ෂණ නිලධාරි
2. සුනිල් අරංගල මැතිතුමා - ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී
3. ඩබ්.එම්.සරත් කුමාර වනසිංහ මයා - කාර්මික නිලධාරි
4. කේ.එම්.ලොකුබණ්ඩා මයා - සංවර්ධන නිලධාරි
5. කේ.එම්.ප්‍රභාත් චින්තක මයා - කළමනාකරණ සේවා නිලධාරි
6. කේ.එම්.එන්.ප්‍රියදර්ශණී මිය - සංවර්ධන නිලධාරි

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීම සුදුසු බවත් එම සමීක්ෂණයේ දී හමුවූ ප්‍රයෝජනයට ගත නොහැකි අබිලි භාණ්ඩ වෙන්දේසි කිරීමට අදාළ කටයුතු මෙම අධීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයන් යොදවා ගෙන ඉටු කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 11**

මොණරාගල වැලියාය පුස්තකාලය පිහිටි ඉඩමෙහි කොටසක් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ලබා දීම සම්බන්ධයෙන් 2011 වර්ෂයේ මොනරාගල ප්‍රාදේශීය සභා මහ සභා වාරයකදී තීරණයක් ගෙන ඇති අතර ඒ අනුව එම ආයතනයට ලබා දීමට නියමිත මෙම ඉඩම් කොටස සම්බන්ධයෙන් නැවත සභා තීරණයක් ගෙන අදාළ ආයතන වෙත දැනුම් දීමට අවශ්‍ය වී ඇති බැවින් සහ එහි ඉතිරි කොටස් ද තක්සේරු කර අවසන් ගිණුමට ගත යුතු බැවින් ඒ සඳහා මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විතානගේ ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

වැලියාය පුස්තකාලය පිහිටා ඇති සභාව සතුව ඉඩමේ කොටසක් ආයුර්වේදය වෙත මීට පෙර සභා තීරණයකින් වෙන්කර ලබා දී තිබුණ ද එය විධිමත්ව සිදුකර නොමැති බැවින් මේ සම්බන්ධව නිතර විගණන විමසීම්වලටද ලක් වන අතර සභා තීරණයක් නැවත ගෙන මෙම වෙන් කිරීම නිශ්චිතවම සිදු කර මෙම ආයුර්වේදය වෙත ලබා දෙන භූමිය වෙන් කර දීම සිදු කළ යුතු බවට විගණනයෙන් පෙන්වා දී ඇති බැවින් මේ සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමන් මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ වන විට මෙම භූමියේ පවතින පුස්තකාල ගොඩනැගිල්ල සහ ආයුර්වේද ගොඩනැගිල්ල අතර මැදිව සකසා ඇති මාර්ගයේ දකුණු පසින් දැනට ආයුර්වේද ගොඩනැගිල්ල පවත්වාගෙන යන කොටසත් ඊට පිටුපසින් ඇති නව ආයුර්වේද නේවාසික ගොඩනැගිල්ලත් සමගම පිටුපස කන්ද තෙක් ඇති කොටසින් පර්චස් 100ක භූමි ප්‍රමාණයක් ආයුර්වේදය වෙත නිශ්චිතවම ලබා දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 12**

ප්‍රාදේශීය සභාවට අයත් මොනරාගල පෙර පාසල් ළමා උද්‍යානය පිහිටි භූමිය තුළ පිහිටා ඇති ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අයත් ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවට පවරා නොගැනීම සම්බන්ධව විගනන විමර්ශනයන්ට ලක් වී ඇති බැවින් මෙම ගොඩනැගිල්ල සභාවට අයත් දේපලක් ඉවත් කර සකස් කර ඇති බැවින් මෙය ඉදිකිරීමට ප්‍රථම අදාල ඉදිකිරීම් කටයුතු අවසන්වූ පසුව සභාවට මෙම ගොඩනැගිල්ල පවරා දෙන බවට ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින් 2003.12.18 දිනැති ඌව/ප්‍රලේ/34 අංක දරණ ලිපිය මගින් දන්වා ඇති බැවින් මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභා දේපලක් ලෙස පවරා ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.ආර්.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මේ සම්බන්ධව පසු ගිය දිනක බදුල්ලේදී පැවති සාකච්ඡාවකදී ද මේ සම්බන්ධව සාකච්ඡාවට බඳුන් වූ අතර මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමෙන් අනතුරුව අප ප්‍රාදේශීය සභාවට භාර දෙන බවට එවකට සිටි ප්‍රධාන ලේකම්තුමා කළ ප්‍රකාශයකට අනුව 2011 වර්ෂයේ දී එය අප වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර, නමුත් මේ තාක් කල් මෙම ගොඩනැගිල්ල සභාවට පවරා දීමක් විධිමත්ව සිදුකර නොමැති අතර මේ සම්බන්ධව නිරතුරුවම විගණන යෙන් විමසීම් කරන බවත් මේ සඳහා නැවත සභා තීරණයක් ගෙන ඒ අනුව මෙම ගොඩනැගිල්ල සභාවට පවරා ගැනීමට අදාළ කටයුතු සිදුකරන ලෙස විගණනයෙන් දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා මෙහිදී ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් එවකට සිටි ප්‍රධාන ලේකම්තුමන් ලිඛිතව දන්වා ඇති බැවින් එහි පිටපත් සහිතව වගකිවයුතු නිලධාරීන් වෙත නැවත දැනුම් දී මෙම පුස්තකාල ගොඩනැගිල්ල නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමේ කටයුතු විධිමත්ව සිදු කර ගැනීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 13**

සර්වෝදය ඡායා ප්‍රාදේශීය සභා වැඩසටහනට අදාලව පසුගිය දිනක මොනරාගලදී පැවති වැඩසටහනකට අනුව හඳුනා ගැනීමට ලක්වූ කරුණු කාරණා ඇතුලත්ව සකස් කර ඇති ව්‍යාපෘති කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කර මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මේ සම්බන්ධයෙන් පූර්ණ පැහැදිලි කිරීමක් සභාවට ඔවුන් විසින්ම සිදු කිරීම සඳහා අද දින මහ සභාවට සහභාගී වීමට ඔවුන්ගේ ඉල්ලීමකට අනුව අවස්ථාව ලබා දුන්නද මේ මොහොතේ ඔවුන් සහභාගී වී නොමැති බැවින් මේ සඳහා සභා තීරණයක් ගැනීම පසුවට කල් තබමු බවට ගරු සභාපතිතුමා මෙහිදී ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු අතර ගරු සභාපතිතුමා විසින් කළ ප්‍රකාශයට අනුව කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 14**

මොනරාගල නගරයට පැමිණෙන බස් රථ රඳවා තැබීම සඳහා මොනරාගල සති පොළ භූමියේ වාහන නැවතුම් ස්ථානයක් ඉදිකිරීමට යෝජනා වී ඇති බැවින් එම ඉදිකිරීම් සිදු කරන ස්ථානයේ පිහිටි ඉවත් කිරීමට නියමිත නිවාස 3ක් සඳහා වෙලේවත්ත සාප්පුවත්ත ඉඩමේ නව නිවාස 3 ක් ඉදි කර දීමට මීට පෙර සභාවාරයකදී අනමත කරන ලදි. එහිදී එක් නිවසක් සඳහා අනුමත ඇස්තමේන්තු ගත මුදල රු.1,000,000.00 ක් වන අතර, වර්තමානයේ පවතින මිල ගණන් යටතේ මෙම ඇස්තමේන්තු ගත මුදලට අදාල ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි බැවින් වර්තමානායේ වෙළඳපොළ පවතින මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස් කර මෙම නිවාස 3 සභා අරමුදලින් ඉදිකිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව නගරයේ රථ ගාල සකස් කිරීමේ කටයුතු සඳහාත් පොළ භූමිය පුළුල් කිරීමේ කටයුතු සඳහාත් මෙම ස්ථානයේ ඉදිකර ඇති දමිළ පවුල්වලට අයත් නිවාස කීපය ඉවත්කර එම ඉවත්කරන නිවාස වෙනුවෙන් සභාවට අයත් සාප්පු වත්ත ඉඩමෙහි සභා අරමුදලින් රුපියල් ලක්ෂ 10 බැගින් වෙන්කර ලක්ෂ තිහක් 30ක් වියදම් කර නිවාස තුනක් ඉදිකර දීම සඳහාත් ජන වසමට අයත් නිල නිවාස දෙක සඳහා සාප්පු වත්ත ඉඩමෙන් පර්චස් 12 බැගින් වෙන් කර දීම සඳහාත් මීට පෙර අනුමැතිය ලබාගෙන ඇති අතර රටේ පැවති තත්ත්වයත් සමඟ මෙම කටයුතු සිදු කිරීම ප්‍රමාද වූ බැවින් මේ වන විට මෙම මිල ගණන් යටතේ මෙම ඉදිකිරීම් කටයුතු සිදු කිරීම ඉතාමත් අපහසු බැවින් අවම වශයෙන් එක් නිවාසයක වැඩකටයුතු සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට ලක්ෂ 15 ත් 16 ත් අතර මුදලක් සභාවෙන් වැය කරන්නට සිදු වන බව ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉදිකිරීම් ද්‍රව්‍ය වල වර්තමාණයේ පවතින මිල ගණන් යටතේ මෙම නිවාස ඉදිකිරීම් සඳහා වැඩිපුර මුදලක් වැය වෙන බැවින් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව දමිළ පවුල් 3 සඳහා වන නිවාස තුනට අදාල ඉදිකිරීම් කටයුතු සාප්පුවත්ත ඉඩමෙහි සිදු කිරීමත්, ජන වසමේ නිවාස දෙක සඳහා පර්චස් 12 බැගින් මෙම භූමියෙන්ම වෙන් කර දීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මොනරාගල මුප්පනේ වසමේ ඉතා අබලන් වූ පහත සඳහන් මාර්ග සඳහා සභා අරමුදල් යටතේ ග්‍රැවල් අතුරා සංවර්ධනය කිරීම සඳහා මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

01. කුමාරපුර 5 වන පටුමගේ අබලන් වූ ඉතිරි කොටස

02. කුමාරපුර සමගි මාවතේ අබලන් වූ හරස් මාර්ගයේ කොටස

03. දොඩම්වත්ත පළමු පටුමගේ අවසානයේ ඇති කොටස

04. දොඩම්වත්ත 4 වන පටුමගේ ඉතිරිවී ඇති කොටස

05. කුමාරපුර 1 පටුමග

06. කුමාරපුර රත්නප්‍රදීප මාවතේ ඉතිරි කොටස

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මන්ත්‍රී චාමර නානායක්කාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

මොනරාගල බල ප්‍රදේශය තුළ පහත සඳහන් ස්ථාන සහා අරමුදල් යටතේ සංවර්ධනය කිරීම සඳහා මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

01. මොනරාගල හිදිකිවුල , බෝගහඅරාව අතුරු මාර්ගයේ පැති බැම්ම සංවර්ධනය කිරීම.

02. මොණරාගල ප්‍රාදේශිය සභාවට අයත් සාප්පුවත්ත ඉඩමෙහි සංචාරක නිවාසයක් ඉදි කිරීම.

03. ටැංවත්ත පොදු ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.4 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මොනරාගල,රත්තනපිටිය, දෙයියන්නෙවෙල මාර්ගය සභා අරමුදලින් ග්‍රැවල් යොදා සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධණ ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.5 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ආර්.උපුල් මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මොනරාගල, හුලන්දාව දකුණ ග්‍රාමයේ අටේ ඇල මාර්ගය සභා අරමුදලින් ග්‍රැවල් දමා සකස් කිරීම සඳහාත් හුලන්දාව දකුන ක්‍රීඩාපිටිය සකස් කර දීම සඳහාත් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ආර්.උපුල් මහතා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.6 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සනත් ගුණවර්දන මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මෙම අවස්ථාවේදී නැගී සිටි සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් මොනරාගල මාගන්දනමුල්ල ළිඳේ කඩේ පසුකරන විට හමුවන දකුණු පැත්තට ඇති මාර්ගය සභා අරමුදලින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා න්‍යායපත්‍රානුකූලව තමන් විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව සංශෝධනය කර ඒ වෙනුවට ඉතා අබලන් තත්ත්වයේ පවතින වෙනත් මාර්ගයක් සංවර්ධනය කිරීමට ජනතාවගේ ඉල්ලීම මත අත්‍යාවශ්‍ය වී ඇති බැවින් ලබන සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට එම සංශෝධිත සංවර්ධන යෝජනාව ඇතුලත් කිරීම සඳහා මහ සභාවෙන් අවසර ඉල්ලා සිටින ලදි. ඒ සඳහා සභාව ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදි.

## 5.7 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.බණ්ඩාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මෙම අවස්ථාවේදී නැගී සිටි පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමන් විසින් බටුගම්මන කොට්ඨාශයේ දෙබැද්දේකිවුල ග්‍රාම සේවා වසමේ කරකොළයාය මාර්ගයේ කරකොළයාය අතුරු මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම සඳහා න්‍යායපත්‍රානුකූලව තමන් විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ද සංශෝධනය කර ඒ වෙනුවට ඉතා අබලන් තත්ත්වයේ පවතින වෙනත් මාර්ගයක් සංවර්ධනය කිරීමට ජනතාවගේ ඉල්ලීම මත අත්‍යාවශ්‍ය වී ඇති බැවින් ලබන සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට එම සංශෝධිත සංවර්ධන යෝජනාව ඇතුලත් කිරීම සඳහා මහ සභාවෙන් අවසර ඉල්ලා සිටින ලදි. ඒ සඳහා ද සභාව ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදි.

## 5.8 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මොණරාගල හොරොම්බුව ග්‍රාම නිලධාරී වසමේ පොකුණුගල අතුරු මාර්ගය ඉතා අබලන් වී ඇති බැවින් එම මාර්ගය පරිහරණය කරන ජනතාවට මහත් අපහසු තත්ත්වයන්ට මුහුණ පාමින් සිටින බැවින් මෙම මාර්ගය සභා අරමුදලින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.9 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තමෝදිරම් ජයජීලන් මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මොණරාගල අලියාවත්ත ස්ටෝරු මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් මෙම මාර්ගය සභා අරමුදලින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තමෝදිරම් ජයජීලන් මහතා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

- **කල් දී නොමැති හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතිය ගත යුතු කල් දී නොමැති හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා සභාවෙන් විමසීම් කළ අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොමැතිව එකඟතාවය පළ කර සිටි බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

I. බෝහිටිය වැදි කුඹුර මොනරාගල ලිපිනයේ පදිංචි ඒ.එච්.වාලිනා මහත්මිය සහ ජේ.පී. හවඩියා යන කාත් කවුරුත් නොමැති ඉතා වයෝවෘද්ධ යුවලක් විසින් කරන ලද ඉල්ලීමක් මත එම දෙපලගේ පාවිච්චිය සඳහා වැසිකිළි ආධාරයක් ලබා දීම සම්බන්ධයෙන් 2021.02.12 දින දී මහා සභාවේ ලබාගත් අනුමැතිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ද ඉදිරිපත් කර ඒ සඳහා ඇස්තමේන්තු ප්‍රකාරව රුපියල් 188341.30 ක මුදලක වැසිකිළි ද්‍රව්‍යාධාරා සභා අරමුදලින් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. නමුත් මේ සම්බන්ධයෙන් ආධාර ලබාදීමට අදාළ යුවල දැනුවත් කිරීමේදී ඔවුන් ඉතා වයෝවෘද්ධ තත්ත්වයේ පසුවන බැවින් වැසිකිළියක් ඉදිකර ගැනීමේ කටයුතු සිදු කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි බැවින් සභාව මගින් එම මුදලට සරිලන පරිදි වැසිකිළියක් ඉදි කර දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලීම් කර සිටින බැවින් එම අනුමත මුදලට සරිලන පරිදි වැසිකිළියක් අප ආයතනයේ මැදිහත් වීමෙන් ඉදිකර දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාවට අනුව කාත් කවුරුත් නොමැති ඉතා වයෝවෘද්ධ දෙපලක් වශයෙන් ජීවත් වන මේ අයට ද්‍රව්‍යාධාර පමණක් ලබා දී වැසිකිළියක් ඉදිකර ගැනීම අපහසු බව දන්වා ඇත්නම් එම අනුමත මුදලේ සීමාව ඉක්මවා නොයන පරිදි එම දෙපලට භාවිත කළ හැකි ආකාරයට සභාව මගින් අදාල වැසිකිළියක් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඉදි කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

II. මොනරාගල ප්‍රාදේශීය සභාවේ අවසන් ගිණුම සකස් කිරීමේදී උසාවි දඩ මුද්දර ආදායම් යනාදී ලැබිය යුතු ප්‍රමාණයට වඩා වැඩිපුර අධිතක්සේරු කර ගිණුම්වල සටහන් කිරීම හේතුවෙන්රු.5,260,291.91 මුදලක් ලැබිය යුතු හිඟ ආදායමක් ලෙස දිගින් දිගටම ගිනුමේ පෙන්නුම් කෙරෙන අතර මෙම මුදල අධිතක්සේරු කර ගිණුම්වලට ගෙන ඇති අගයක් වන අතර මෙම අගය කිසිසේත්ම අයකරගත නොහැකි බැවින් මෙම මුදල ගිණුමෙන් කපා හැරීම සුදුසු බවට 2018.06.22 දින සභා තීරණයක්ද ලබා ඇති නමුත් එය මෙතෙක් කපා හැර නොමැති බැවින් 2021 වර්ෂයේ ගිණුමෙන් මෙම මුදල ඉවත් කර ගැනීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙසේ අධි තක්සේරු කර ගිණුම් ගත කර ඇති මුදල් අය කර ගැනීමටද නොහැකි බැවින් ප්‍රාදේශීය සභා ගිණුමෙන් ඉවත් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

III.පසු ගිය දිනක ඌව පළාත් ආණ්ඩුකාරතුමා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත හදිසියෙ කැඳවා ලබාදුන් උපදෙස් වලට අනුව කොම්පෝස්ට් පොහොර සකස් කිරීම කඩිනම් කරන ලෙස ලබා දුන් උපදෙස්වලට අනුව අප ආයතනයට වල් කැබලි කරන යන්ත්‍රයක් මිලදී ගැනීම ඉතා කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය වූ බැවින් අප විසින් ආයතන කිහිපයකින් ම මෙම යන්ත්‍රය සම්බන්ධයෙන් තොරතුරු දුරකථනයෙන් විමසීම් කිරීමේදී සහ සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයන් වල දී හම්බෙගමුව ප්‍රදේශයේ පවතින නිෂ්පාදන ආයතනයකින්ම රුපියල් 365000.00 ක අවම මුදලකට මෙම යන්ත්‍රය මිලදී ගැනීමට හැකියාව පවතින බවත් අපගේ අවශ්‍යතාවය මත ඉතා කඩිනමින් එය ගෙන්වා ගැනීමද මෙම ආයතනයෙන් සිදුකරගැනීමේ හැකියාවක් පවතින බැවින් හම්බෙගමුව ප්‍රදේශයේ පවතින මෙම නිෂ්පාදිත ආයතනයෙන් අදාළ යන්ත්‍රය මිලදී ගැනීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉතා කඩිනමින් මෙම මිලදී ගැනීමේ අවශ්‍යතාවය මත සහ ආයතන වලින් සිදු කරනු ලැබූ විමසීම් වලට අනුව ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලද අදාල මිල ගණන් යටතේ මෙම ආයතනයෙන් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මෙම වල් කැබලි කිරීමේ යන්ත්‍රය සභාව වෙත මිලදී ගැනීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

IV.මීට පෙර ලබාගත් සභා තීරණයක් මත නව බස් බස් නැවතුම්පොළේ වෙළඳ සංකීර්ණයේ භාවිතයට නොගෙන අතහැර දමා තිබූ පැරණි වැසිකිළි පද්ධතිය කඩා ඉවත් කර ලියා පදිංචි සමිතියක් මගින් කර්මාන්තයක් වශයෙන් නව කඩ කාමර හතරක් ඉදිකිරීමට කටයුතු කරන ලද අතර සභාවට විශාල ආදායමක් මෙමගින් ලබාගත හැකි බැවින් මෙම කඩ කාමර 4 ඉතා කඩිනමින් වැඩ අවසන් කර ටෙන්ඩර් කිරිමට උපදෙස් ලබා දී ඇති අතර මෙහි දෙවන අදියර වශයෙන් කඩ කාමර 04ට විදුලිය ලබාගෙන තීන්ත ආලේප කිරීම කඩිනමින් සිදු කළ යුතු බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මීට පෙර සභා තීරණයක් මගින් මෙම ස්ථානයේ ඉදි කරන ලද මෙම නව වෙළඳ සැල් හතර සඳහා දෙවන අදියර වශයෙන් ලියාපදිංචි සමිතියක් හරහා කර්මාන්තයක් ලෙසින් තීන්ත ආලේප කිරීමේ කටයුතු සහ විදුලිය ලබා ගැනීමේ කටයුතු ඉතා කඩිනමින් සිදුකර විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මෙහි වැඩ අවසන් කර ටෙන්ඩර් පටිපාටියට අනුව බදු දීමට කටයුතු කර සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 06. ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2022.01.01 දින සිට 2022.01.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව රංජිත් රත්නායක ගරු මන්ත්‍රිතුමන්ගේ සහ කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ විරෝධතාවයන් නොමැතිව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම

ඉදිරිපත් වී නොමැත

## 08. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 8.1 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ආර්.උපුල් මැතිතුමා</u>

I. අවසර ගැනීමෙන් අනතුරුව කලවැල්ආරගම කණිෂ්ඨ විද්‍යාලයේ මේ වන විට දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉතාමත් මැනවින් සිදු කර ගෙන යන අතර මෙහි ඉතාමත් අඩු දරුවන් ප්‍රමාණයක් අධ්‍යාපනය ලබන අතර විශේෂයෙන්ම 6 වසර සිට 11 වසර දක්වා පන්ති කාමර තුළ ඉතා අසරණ ආර්ථික අපහසුතා රැසක් මැද දිවි ගෙවන පවුල් වල දරුවන් හතර පස් දෙනකු පමණක් ඉගනුම ලබන අතර මෙම දරුවන් කිහිප දෙනා අවට ඇති හොරොම්බුව , කුඹුක්කන ප්‍රදේශ වල පවතින මහා විදුහල් වලට ඇතුළත් වී ඉතා හොඳ අධ්‍යාපනයක් ලැබීම සඳහා දැඩි කැමැත්තක් හා උනන්දුවක් දක්වන අතර මෙම විදුහල 1 වසර සිට 5 වසර දක්වා පමණක් පන්ති පැවැත්වෙන ප්‍රාථමික විදුහලක් බවට පත්කර දැනට පහ වසරෙන් ඉහළ 11 වසර දක්වා අධ්‍යාපනය ලබන දරුවන් කිහිප දෙනා අවට ඇති මහ විදුහල් වෙත යොමු කරවීම සම්බන්ධයෙන් කලාප කාර්යාලයෙන් ද විමසා සිටිය දී කලාප අධ්‍යක්ෂ තුමියගේ එකඟතාවය මේ සඳහා පළ කර සිටි බැවින් සභාව මගින් ඉහළ නිලධාරීන්ට මේ සම්බන්ධව දැනුම් දී මෙම පාසලේ ඉහළ ශ්‍රේණිවල ඉගෙනුම ලබන දරුවන් කිහිප දෙනා අවට ඇති විදුහල් වෙත යොමුකර ඔවුන්ගේ අනාගතය සාර්ථක කර ගැනීමට උපකාරයක් කරමු බවට ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම කොරෝනා මර්ධන එන්නත්කරණය ජනතාවට ලබා දී මේ වන විට මරණ අනුපාතිකය ඉතාමත් අවම මට්ටමක පවත්වාගෙන යාමට හැකිවී තිබීම සම්බන්ධයෙන් ඉතා සතුටු විය හැකි කරුණක් වන නමුත් තුන්වෙනි මාත්‍රාව එන්නත් කර ගැනීමට මේ වන විට බොහෝ දෙනෙකු පසුබැමකට ලක්ව තිබීම මගින් යළිත් මෙම වසංගතය හිස ඔසවන තත්ත්වයක් ගෙන ඇති අතර මුල් අවස්ථාවේදී කටයුතු කළා හා සමානව නැවතත් මේ සම්බන්ධව උනන්දුවෙන් කටයුතු කළ යුතු බැවින් ගම්වලට ගොස් ජනතාව දැනුවත් කර මෙම එන්නත් කරන කටයුතු සම්පූර්ණ කර ගන්නා ලෙස අවබෝධ කර දීමට අවශ්‍ය සියලු කටයුතු ක්‍රියාත්මක කළ යුතු බවට ගරු මන්ත්‍රී තුමා ප්‍රකාශ කරන ලදී.

III. ඒ වගේම තම කොට්ඨාෂයේ තවත් අතුරු මාර්ග කිහිපයක්ම කපා සකස් කර ගැනීමට ඇති බැවින් ඒ සඳහා මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන ලෙසත්, ඒ වගේම පසුගිය දිනවල දැවැන්ත ලෙස සිදු කරන ලද මාර්ග ව්‍යාපෘති, නිවාස ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය වල මිල ගණන් ඉතා සීග්‍ර ලෙස ඉහළ යාමේදී ප්‍රදේශයේ මෙම කටයුතු සාර්ථක කර ගැනීමට ආයතන කිහිපයකින්ම පාලන මිල ගණන් යටතේ සිමෙන්ති ඇතුළු ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධයෙන් ද විශේෂයෙන්ම සමුපකාර සෙඩ් එක ඉදිරිපිට ඇති රිච්වෙ හාඩ්වෙයාර් ආයතනයේත්, සිටි හාඩ්වෙයාර් ආයතනයේත් වෙළෙඳ ව්‍යාපාරික මහත්වරුන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී තුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම

- කලවැල්ආරගම විදුහලේ ප්‍රශ්නය මෙවර පැවැත්වීමට නියමිත ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත යොමුකර විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමු බවත්, ඒ වගේම corona එන්නත් කරන කටයුතු සිදු කිරීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් දැනුවත් කිරීම් කටයුතු සිදු කරන අතර අවශ්‍යතාවයක් වුවහොත් සභාව මගින් මෙම දැනුම්දීම් කටයුතු සිදු කළ හැකි බවත්, ඒ වගේම ලබන සතියේ සභාවේ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය ලබාගෙන අවශ්‍ය මාර්ග කපා ගැනීමට කටයුතු කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 8.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා

I. අවසර ගැනීමෙන් අනතුරුව නක්කල බිබිල මාර්ගයේ දිස්ත්‍රික් කාර්යාලය පසුකරනවාත් සමඟ වංගුවෙහි කොමර්ෂල් ක්‍රෙඩිට් ආයතනය විසින් ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරුව සවි කර ඇති ආකාරය අනුව රථ වාහන රියදුරන්ට විශේෂයෙන්ම නක්කල සිට හුලංදාව දෙසට පැමිණෙන වාහන සඳහා මෙම දැන්වීම් පුවරුව නිසා අනතුරුදායක තත්ත්වයක් ගෙනදීමේ අවධානමක් පවතින බැවින් මේ සම්බන්ධව සොයා බලා එම ආයතන දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කරන්න කියා ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම උපුල් මන්ත්‍රී තුමන් විසින් කලවැල්ආරගම විදුහල සම්බන්ධව ගෙන ආ කාරණාව කාලෝචිත වශයෙන් ඉතාමත් වැදගත් සහ සිදුවිය යුතු කාරණාවක් බැවින් මේ සම්බන්ධව සොයා බලා අදාල කටයුතු සිදු කිරීම ඉතාමත්ම අගනා කටයුත්තක් වන බවත්, ඒ වගේම මෙම පාසල කිසිසේත්ම වැසී යාමට ඉඩ නොතැබිය යුතු අතර ඒ අවට පාසල් වලට 1 වසර සිට 5 වසර දක්වා දරුවන් බාර ගැනීමේ දී මෙම පාසලට යා හැකි සියලුම ප්‍රාථමික දරුවන් එම පාසල වෙතම යොමු කරවීමට කටයුතු කිරීමට අදාළ පාසල් විශේෂයෙන් කුඹුක්ක සහ රාජ්‍යානන්ද විදුහල්වලට මේ සම්බන්ධව දැනුවත් කර තැබීමක් සිදු කර තිබීම ද අත්‍යවශ්‍ය කාරණාවක් බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා අදාල කටයුතු සිදු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම තෙනගල්ලන්ද, කහම්බාන, ඉත්තෑකටුව ආදී ප්‍රදේශවල පවතින ඉඩම් ප්‍රශ්නය මේ වන විට විශාල අර්බුදයක් බවට පත්ව ඇති අතර පරම්පරා ගණනාවක්ම පොදුජන පෙරමුණ වෙනුවෙන් ඡන්දය ලබා දී එම පක්ෂය සමග දිගින් දිගටම රැඳී සිටින මෙම ගොවීන්ට අද වන විට බෙහෙත්, පොහොර මෙන්ම වගා කරමින් ජීවිතය පවත්වාගෙන ගිය භූමියද අහිමිවී යන තත්ත්වයකට පත්වී ඇති බවට ඔවුන් විසින් මැසිවිලි කරන අතර කුමන ආණ්ඩු පක්ෂයක් නියෝජනය කළද දේශපාලනයෙන් තොරව මේ ගොවීන් පත්ව ඇති මෙම අසාධාරණයට මානුෂීය වශයෙන් අපි කවුරුත් අවධානය යොමු කළ යුතු බවත්, විශේෂයෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී අමාත්‍ය තුමන් ඇතුළු වග කිව යුතු සියලුම නිලධාරීන් ඉතාමත් අන්තවාදීව මෙම ප්‍රශ්ණයේදී ක්‍රියා කරන අතර පවතින රජය මෙන්ම මෙම ප්‍රදේශය භාරව කටයුතු කරන සියලුම දේශපාලන අධිකාරිය මේ සඳහා මැදිහත් වීම ඉතාමත් මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කරන අතර පවතින රජයත් සමඟ පරම්පරා ගණනාවක් තිස්සේ සිටින මේ අහිංසක ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය කෙසේ හෝ විසඳා දෙන ලෙසත් එසේ නොවුණහොත් ඉදිරි දිනවලදී දැවැන්ත උද්ඝෝෂණයකට මේ ගොවියන් සමග තම පක්ෂයේ සියලුම දෙනා ද පෙළ ගැසෙන බවට ගරු මන්ත්‍රීතුන් සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම පසුගිය දිනක ලෝක තෙත්බිම් දිනය සැමරීමේ දී මොණරාගල දිස්ත්‍රික්කය තුළ තෙත්බිම් ඕනෑතරම් තිබියදී මේ සඳහා මොනරාගලින් සංවිධානය කරන ලද වැඩසටහන

සැමරීමට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ජලාශය ආශ්‍රිත ප්‍රදේශය යොදාගෙන තිබීම සම්බන්ධයෙන් පුවත්පතක තොරතුරු පළ වී තිබූ අතර සුද්දන්ගේ කාලේ සිටම ඌව වෙල්ලස්සට සිදුවන මේ කෙනෙහෙලිකම් වලට සම්පූර්ණයෙන්ම විරුද්ධත්වය ප්‍රකාශ කර සිටින බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

V. ඒ වගේම ඉදිරි කාලය තුළ ජනතාවට මහත් පීඩනයන් ගෙන දෙන වාතාවරණයක් රට තුළ ගොඩනැගෙමින් පවතින අතර පක්ෂ භේදයකින් තොරව නිරතුරුවම ජනතාව වෙනුවෙන් පෙනී සිටීමට ජනතාව වෙනුවෙන් කතා කිරීමට අප සියලු දෙනාම වගකීමෙන් යුතුව කටයුතු කළ යුතු බැවින් නිරතුරුවම ඒ සඳහා අවධානය යොමුකර කටයුතු කරන්න කියා ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී තුමා සියලු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නක්කල මාර්ගයේ දැන්වීම් පුවරුව සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කරන බවත්, ඒ වගේම ගොවීන්ගේ ඉඩම් ප්‍රශ්නයේදී අධ්‍යක්ෂ ජනරාල් ඇතුළුව අදාල ලේකම්වරු සියලු දෙනා පසුගිය දිනක පැමිණ මේ සම්බන්ධව සොයා බලා සාකච්ඡා කළ අතර ඉතා කඩිනමින් අක්කර පහ බැගින් ගොවියන්ට නිරවුල් කර ලබාදෙන බවට ඔවුන් එහිදී පොරොන්දු වූ බැවින් ඉදිරියේ දී ඒ සඳහා විසඳුම් ලැබෙයි බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 8.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා</u>

I. අවසර ගැනීමෙන් අනතුරුව කලුගලයාය, මදුරුකැටිය මාර්ගය මේ වන විට කුට්ටි ගල් අතුරා සංවර්ධනය කර ඉතාමත් හොඳින් ජනතාව මාර්ගය භාවිතා කරන අතර, නමුත් පසුගිය කාලයේ දී ජල ව්‍යාපෘතියක් මගින් මෙම මාර්ගය එක් පැත්තකින් හැරීමකට ලක්කර එහි බොහෝ ප්‍රමාණයක් ගල් ගලවා ඉවත් කර මාර්ගය විනාශ කර දමා අනතුරුදායකව පවතින අතර මේ වන විට මෙසේ ගලවා දමා තිබූ ගල් ප්‍රමාණයද අස්ථානගත වී ඇති බවත් මේ සම්බන්ධව ජල සම්පාදන ආයතනයෙන් විමසීම් කළ ද නිසි පිළිතුරක් ලබා නොදෙන බැවින් සභාවේ අපි කිහිප දෙනෙකු හෝ එකතු වී අපේ නිලධාරීන් සමග මෙයට මැදිහත්වී අවශ්‍ය පියවර ඉතා කඩිනමින් ගත යුතු බවත් මෙම මාර්ගය යථා තත්ත්වයට පත්කර ජනතාවට අවහිරයකින් තොරව ගමන් කිරීමට සකස් කර දිය යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදි.

II. ඒ වගේම බල ප්‍රදේශය තුළ මීට අවුරුදු දහයකට පමණ පෙර කොන්ක්‍රීට් කරන ලද මාර්ග බොහෝ ස්ථාන වලින් යම් යම් සුළු පලුදු වීම් වැනි දෑ නිර්මාණය වී ඇති අතර සභා යෝජනාවක් ගෙන මේ සඳහා යම් ව්‍යාපෘතියක් ආරම්භ මෙම මාර්ග සියල්ලම අධීක්ෂණය කර සියලුම කඩතොලු වී ඇති ස්ථාන සකස් කර දීර්ඝ කාලයක් මෙම මාර්ග පවත්වා ගෙන යාමට හැකි බැවින් ඒ සඳහා අවධානය යොමුකර අවශ්‍ය කටයුතු සිදු කරමු බවට ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම ප්‍රදේශය තුළ විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරමින් සෑම ග්‍රාම නිලධාරී වසමක්ම නාගරීකරණය වෙමින් පවතින මොහොතක අප බල ප්‍රදේශයේ පවතින සියලුම සුසානභූමි සම්බන්ධයෙන් සංගණනයක් සිදු කර විශේෂයෙන්ම නක්කල 22 සොහොන් පිටියට ප්‍රවේශ මාර්ගයක් වත් නොමැති අතර මෙවැනි සුසාන භූමි බොහෝ ප්‍රමාණයක් පවතින අතර එවැනි අඩු පාඩු සියල්ලම සකස් කර සුසාන භූමි සියල්ලම විධිමත්ව ආරක්ෂාකාරීව පවත්වාගෙන යා යුතු බැවින් ඒ සඳහා අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරමු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී තුමා සියලු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- කලුගලයාය මදුරුකැටිය මාර්ගය ජලය ලබාදීම සඳහා කාණු කැපීම හේතුවෙන් එහි යම් ස්ථාන වලින් ගල් ගලවා ඉවත් කිරීමට සිදුව ඇති අතර මෙම මාර්ගය සභාවට අයත් මාර්ගයක් බැවින් ඒ පලුදු කර ඇති ස්ථාන සියල්ලම සභාව මගින් කොන්ක්‍රීට් යොදා සකස් කරමු බවත්, එසේම කාපට් වීමට නියමිත මාර්ග හැර සකස් කර ඇති අනෙකුත් සියලුම කොන්ක්‍රීට් මාර්ගවල පවතින අඩු පාඩු සකස් කිරීමට කමිටු පිහිටුවා කටයුතු කිරීම සඳහා සභාවේ වාහන සහ යන්ත්‍ර සූත්‍ර වල ප්‍රශ්න විසඳා ගැනීමෙන් අනතුරුව විධිමත්ව සිදු කරමු බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා</u>**

- අනතුරුව සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ මාර්තු මස 11 වන දින ප.ව.2.30 ට යොදා ගනිමු බවට සභාවේ සියළු දෙනාගේම එකඟතාවය මත යෝජනා කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි උප සභාපතිතුමන් ඇතුළුව සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.00 ට පමණ අවසන් කරන ලදී.

- 2022.02.18 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.....................................................................................................යෝජනාවෙන් සහ.........................................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

| | | | |
|---|---|---|---|
| මුදල් හා ප්‍රතිපත්ති සැකසීම් කමිටුව | තාක්ෂණික සේවා කමිටුව | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | පරිසර හා පහසුකම් කමිටුව |

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.............................................................................................................යෝජනාවෙන් සහ.................................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරිමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරීම නතර කිරීමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු

බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි.

තවද න්‍යාය පත්‍රය සකස් කිරීමෙන් අනතුරුව අප වෙත ලැබුණු දැනුම් දීමකට අනුව මෙම ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු 2021 නොවැම්බර් මස 30 වන විට අවසන් කර බිල් පත් ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙය හදිසි යෝජනාවක් ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා මහ සභාවේ සියලු දෙනාගේ එකඟතාවය ලබා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනව ද මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

I. තවද මාර්ග අමාත්‍යාංශය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිලියන 52ක් වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් මාර්ග 49ක් සංවර්ධනය කළ යුතුව ඇත.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම මඩුල්ල, සියඹලාණ්ඩුව, බුත්තල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ද මෙම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරිමේදී රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදිය යුතු බවට දන්වා ඇති අතර මෙම බල ප්‍රදේශ 4ටම රෙඩි මික්ස් සපයන ආයතන ඇත්තේ දෙකක් පමණක් බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර මෙම ආයතන දෙක මගින් මෙම මාර්ග සියල්ලටම රෙඩි මික්ස් සැපයීය යුතු අතර 2021 නොවැම්බර් මසට 30 දිනට පෙර අදාල මාර්ග වල ඉදිකිරීම් අවසන් කර මාර්ග අමාත්‍යාංශය වෙත බිල් පත් ඉදිරිලත් කළ යුතුව ඇත. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් සංවර්ධනය කෙරෙන මාර්ග වැඩි ප්‍රමාණයක් පටු බව සහ බෑවුම් සහිත වීම නිසා රෙඩිමික්ස් ප්‍රවාහනයට අපහසු තත්ත්වයක් පවතින අතර කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍රය යොදවාගෙන මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇති පරිදි අදාල උපදේ හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතිවල කටයුතු අදාල දිනට පෙර සිදු කිරීම සුදුසු බවටත්, කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍ර යොදවාගනිමින් මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.